“සහශ්‍රකයේ ඇදුරෝ”

“සිප් කිරි පෙවූ මූසිලයන් උඩු මහලේ
අපෙ ගුරුතුමා යයි තාමත් ඉස්කෝලේ”

රජ කාලේ පටන් ඉගැන්වීමේ පුරුද්ද ආරම්භවූ ශ්‍රී ලංකාවේ, සිප්හල් සහ ඇදුරුතුමන් ආදී වූ සියල්ලම විශ්වය තරණය කිරීම දක්වා සිසුන් හට මග පෙන්වීමේ කාර්යයේදී හා සහශ්‍රකයේ අවශ්‍යතා වලට ගැළපෙන දරුවකු නිර්මාණයේදී, ගුරුවරයා දැනුමින් හා නව තාක්ෂණයෙන් සන්නද්ධ විය යුතුය.

එද ගුරුවරුන් සමග සිටි මුසිලයන් අද ඒ ගුරුවරුන් අභිබවා තාක්ෂණ දැනුමින් යුතු වූවෝ වෙති. වර්තමානයට ද ගැළපෙන ලෙස ඉගෑනුම් ඉගැන්වීමේ කාර්යයේදී ගුරුවරයා කලු ලෑල්ලෙන් ඔබ්බට ගොස් ඩිජිටල් තිරය දෙසටද යොමු විය යුතුය. මේ කාර්යයේදී Intel® Teach පුහුණු පාඨමාලාව ගුරුවරයාට මහා තෝතැන්නක් විය.

අප සබරගමුව පළාතේ ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයේ ඇඹිලිපිටිය නගරය මධ්‍යයයේ විශාල භූමි භාගයක පිහිටා ඇති ර/ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලයේ ගුරුවරුන් වෙමු, අප පාසල සබරගමු පළාතේ වැඩිම සිසුන් ප්‍රමාණයක් ඉගෙනුම ලබන, ජාත්‍යන්තර තලයේ ක්‍රීඩකයන් බිහි කල දීර්ඝ ඉතිහාසයක් ඇති දීප්තිමත් විද්‍යාලයකි.

විදුහල්පති - ලයනල් විජෙසිංහ මයා

මෙම Intel® Teach පුහුණුව සඳහා අප පාසලෙන් ප්‍රධාන ගුරුවරුන් ලෙස සහභාගි වූ අප දෙදෙනා පාසලේ අනෙකුත් ගුරුවරුන් හටද පුහුණුව ලබා දීමට අවශ්‍ය කටයුතු 2009.07. 24 දින ආරම්භ කරන ලදී.මුලින්ම මේ වැඩසටහන සඳහා ගුරුවරුන්ගේ අවධානය දිනා ගැනීමට පරිගණක විද්‍යාගාරයේ දැන්වීම් පුවරුවේ “**ඔබත් සහශ්‍රකයේ ඇදුරෙක්ද?**” ලෙස EQ එකක් ප්‍රදර්ශනය කරන ලදී. මෙය දුටු ගුරුවරුන් පැමිණ කරන ලද විමසීම් වලින් සහ දැනුවත් කිරීම් වලින් පසු අප විදුහල තුලින්ම ගුරුවරුන් 40 දෙනෙකු පුහුණුව සඳහා සහභාගී කරවා ගැනීමට හැකි විය. මෙම වැඩසටහන ආරම්භයේදී සිටම ඔවුන් උනන්දුවෙන් හා කැප වීමෙන් සහභාගී විය.

තමුත් මෙම පුහුණු වැඩසටහන නියමිත කාලරාමුවට අනුව නිම කිරීම, අප මුහුණ දුන් ප්‍රධාන අභියෝගයයි. එයට හේතුව වූයේ ප්‍රාථමික අංශයේ හා ද්විතියික අංශයේ ගුරුභවතුන් මිශ්‍රවී මෙයට සහභාගී වීම නිසාය. මෙම වැඩසටහන පාසල් දෙවැනි වාර විභාගය පැවැත්වූ දිනවල විභාගයෙන් පසු පැවැත්වූ නිසා ප්‍රාථමික අංශයේ ගුරු භවතුන් සමග ප්‍රමාද වී ආරම්භ කිරීමට සිදු විය. එනිසා සති අන්තයේ ද මෙම වැඩසටහන පවත්වා පැය 54 කින් අවසන් කිරීමට සිදු විය.

ගුරුවරයාගේ භූමිකාවේදී වර්තමාන ගුරුවරයා මුහුණ දෙන අභියෝගයක් වනුයේ සිසුවා නව ක්‍රමවේද හා නවීන තාක්ෂණය භාවිතයට වඩාත් යොමු වී සිටීම හා ඒවාට ඇල්මක් දැක්වීමයි. ගුරුවරයා මේ අභියෝග ජයගත යුතු වේ. Intel® Teach වැඩසටහනට යොමු වීම නිසා සිසුන් ගේ අධ්‍යාපන අවශ්‍යතා වලට වඩාත් ගැළපෙන නවීන ගුරුවරයෙකු බවට පත් වීමට අප විද්‍යලයේ ගුරුවරුන්ට හැකි විය.

ඒ.කේ.ඩී.ශිරෝමා වීරතුංග මිය

අප සමග කටයුතු කිරීමේදී ගුරුවරුන් වෙනදට වඩා උනන්දුවෙන් පරිගණක විද්‍යාගාරයට පැමිණීම සිදු වූ අතර පරිගණකය ඇසුරින් නව දෑ අධ්‍යයනයට ද බහු මාධ්‍ය භාවිතයෙන් ව්‍යාපෘති නිර්මාණයටද යොමු විය. වර්තමානය වන විටද ගුරුවරුන් සිසුන් සමග බහුලව පරිගණක විද්‍යාගාරය භාවිතයට යොමුවී ඇත.

ඩී. ජී. ඒ. ඩබ්. ආර්. සී. බණ්ඩාර මිය

මිට අමතරව Intel® Teach පුහුනු වැඩසටහනට ප්‍රධාන ගුරුවරුන් ලෙස සහභාගී වීමෙන් පසු ගුරුවරුන් 40 දෙනෙකු සාර්ථක ලෙස පුහුණු කරවා නිමා කිරීම නිසා අප දෙදෙනා සබරගමු පළාතේ හොඳම "Master Teacher" වරුන් 10 දෙනා අතරින් දෙදෙනෙකු ලෙස 2011 ජූලි මස සම්මාන ලබන ලදී. ඒ. කේ. ඩී. ශිරෝමා වීරතුංග මිය සබරගමු පළාතේ තෙවන ස්ථානය ද ඩී. ජී. ඒ. ඩබ්. ආර්. සී. බණ්ඩාර මිය සබරගමු පළාතේ සිව්වන ස්ථානය ද ලබාගන්නා ලදී.

ඩී. ජී. ඒ. ඩබ්. ආර්. සී. බණ්ඩාර මිය සහ ඒ.කේ.ඩී.ශිරෝමා වීරතුංග මිය

ර/ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යලය,

සබරගමු පළාත.